**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

--------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුනි 25 දින ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාව වෙත ලබාදෙන ලද රු.265,000 ක් වූ අඩි 10 X 10 ජංගම කුටි දහයක වටිනාකම රු.120,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.145,000 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) මුතුමාල පන්සල් මාර්ගය පස් කපා සකස් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.11,750 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය හා 2014 දෙසැම්බර් 31 දිනට ණයහිමියන්ගේ වටිනාකම රු.11,750 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.19,160 ක් හා පසුගිය වර්ෂයන් වෙනුවෙන් ගෙවිය යුතු රු.32,022 ක දායක මුදල් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය රු.19,160 ක් අඩුවෙන්ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුම් ශේෂය රු.51,182 ක් වැඩියෙන් ද ණයහිමියන්ගේ වටිනාකම රු.51,182 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.10,994,391 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,267,807 ක් විය.

1.3.3 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මුදල් රෙගුලාසි 137-139 | ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා එම ද්‍රව්‍ය ලැබීමට පෙර අවස්ථා දෙකකදී පිළියෙල කරන ලද වටිනාකම රු.79,385 ක් වූ චෙක්පත් 02 ක් 2015 අප්‍රේල් 10 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ, විශ්‍රාම ලැබූ, සේවය හැර ගිය හා තොරතුරු විගණනයට ඉදිරිපත් නොකළ සේවකයින් 07 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.11,876 ක් අයකර ගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,062,334 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.741,348 ක් විය. ඒ අනුව රු.1,320,986 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**
---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
------------------------------------

2014 ජනවාරි 01 දිනට පැවති හිඟ වරිපනම් බදු හා අක්කර බදු අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 32.1 ක් හා සියයට 8.2 ක තරම් දුර්වල මට්ටමක පැවතිනි.

2.2.2 **වෙනත් ආදායම්**
-----------------

සභා බල ප්‍රදේශය තුල ඉදිකර ඇති සන්නිවේදන කුළුණු වෙනුවෙන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.5,704,344 ක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
--------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
----------------------------------

(අ) සභාව විසින් පවත්වාගෙන ගිය උඩවෙල ජල සම්පාදන ක්‍රමය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පැවරීමේ අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව සභාවට පාරිභෝගිකයින්ගෙන් අයවිය යුතුව පැවති රු.562,589 ක හිඟය ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත පවරා එම මුදල එම ආයතනයෙන් සභාවට අයකර ගතයුතු වුවද, එසේ අයකර නොගෙන සභාවේ හිඟ ආදායම් යටතේ දක්වා තිබුණි.

(ආ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ක්‍රියාවලීන් විධිමත් සමීක්ෂණයක් මඟින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය